# කොළඹ මහා නගර සභාව

## පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ තනතුරු වල III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීම සහ ගිනිහට (Fireman) තනතුර සඳහා බඳවා ගැනීම හා භෙසජ්ජක (Ayurvedic Pharmacist) තනතුර සඳහා බඳවා ගැනීම

කොළඹ මහා නගර සභාවේ පුරප්පාඩුව පවතින අනුව පහත තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා බාහිර බඳවා ගැනීම් සිදු කිරීමට බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි පහත සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් පහත දක්වෙන ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තෙහිම යතුරු ලියනය කොට හෝ පැහැදිලි අත් අකුරින් පිළියෙළ කර ගත් අයදුම්පත් "නාගරික කොමසාරිස්, නාගරික කොමසාරිස් කාර්යාලය, කොළඹ මහා නගර සභාව, පුරහල, කොළඹ 07" යන ලිපිනයට 2020.12.28 වන දිනට ප්‍රථම ලැබෙන ලෙස ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පතේ සහ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, අයදුම්පත බහාලන කවරයේ වම් පස ද ඔබ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. නිසි ලෙස සම්පූර්ණ නොකළ හා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම් / පළපුරුද්ද රහිත හා 2020.12.28 දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**01. තනතුරු නාමය : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පළාත් පාලන ආයතන වල කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන බණ්ඩ 2 සේවා ගණයේ තනතුරු - III ශ්‍රේණිය**

1.1
- 01. පෙර පාසැල් ගුරු
- 02. පුස්තකාල සහකාර
- 03. සෞඛ්‍ය උපදේශක
- 04. මැහුම් උපදේශක
- 05. උපදේශක (කාර්මික පුහුණු)
- 06. ප්‍රදර්ශක උපදේශක
- 07. සංගීත හා නැටුම් උපදේශක
- 08. උපදේශක (පරිගණක පුහුණු)
- 09. ක්‍රීඩා උපදේශක

**1.2 මාසික වැටුප් පරිමාණය :** MN1-2016 (රා.ප.ච. 03/2016 අනුව)
රු. 27140 - 10 x 300 - 11 x 350 - 10 x 495 - 10 x 660 - 45,540

**1.3 වයස් සීමාව / අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම් / වෙනත් සුදුසුකම්**

| | තනතුර | වයස් සීමාව | අධ්‍යාපන සුදුසුකම් | වෘත්තීය සුදුසුකම් | පළපුරුද්ද |
|---|---|---|---|---|---|
| 01 | **පෙර පාසල් ගුරු** | අ. 18 නොඅඩු අ. 30 නොවැඩි | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) ත් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපනය හා ළමා සංවර්ධනය පිළිබඳව මාස 06 ට නොඅඩු කාලයක් පාඨමාලාවක් හදාරා සහතිකයක් ලබා තිබිය යුතුය. | |
| 02 | **පුස්තකාල සහකාර** | අ. 18 නොඅඩු අ. 30 නොවැඩි | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) ත් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ හෝ පිළිගත් විශ්වවිද්‍යාලයක පුස්තකාල හා විද්‍යාපන විද්‍යා ඩිප්ලෝමාවේ ප්‍රථම පරීක්ෂණය සමත්ව තිබීම. | |
| 03 | **සෞඛ්‍ය උපදේශක** | අ. 18 නොඅඩු අ. 30 නොවැඩි | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) ත් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | ජාතික සමාජ සංවර්ධන ආයතනය විසින් පවත්වනු ලබන සමාජ වැඩ පිළිබඳ ද්විවර්ෂ පාඨමාලාව හදාරා සහතික ලබා තිබීම. | රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක උපදේශක තනතුරක වසර 02 ට නොඅඩු කාලයක් උපදේශකයෙක් ලෙස කටයුතු කර සහතික ලබා තිබීම. |
| 04 | **මැහුම් උපදේශක** | අ. 18 නොඅඩු අ. 30 නොවැඩි | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) ත් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | මැහුම් ශිල්පය සම්බන්ධයෙන් රජයේ ආයතනයක 06 මාසයක හෝ ඊට වැඩි පාඨමාලාවක් හදාරා අවසාන සහතිකපත්‍රය ලබා තිබීම. පෞද්ගලික ආයතනයක නම් මැහුම් විෂය පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම. | රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක උපදේශක තනතුරක වසර 02 ට නොඅඩු කාලයක් උපදේශකයෙක් ලෙස කටයුතු කර සහතික ලබා තිබීම. |
| 05 | **උපදේශක (කාර්මික පුහුණු)** | අ. 18 නොඅඩු අ. 30 නොවැඩි | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) ත් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක යාන්ත්‍රිකරණය පිළිබඳ වසර 2 1/2 ක පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබිය යුතුය. ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) සහතික 4 වන මට්ටම හෝ ඉහළ සුදුසුකම් ලබා තිබීම අවශ්‍ය වේ. | රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක උපදේශක තනතුරක වසර 02 ට නොඅඩු කාලයක් උපදේශකයෙක් ලෙස කටයුතු කර සහතික ලබා තිබීම |
| 06 | **ප්‍රදර්ශක උපදේශක** | අ. 18 නොඅඩු අ. 30 නොවැඩි | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) ත් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක යාන්ත්‍රිකරණය පිළිබඳ වසර 2 1/2 ක පාඨමාලාවක් හදාරා අවසාන සහතිකය ලබා තිබිය යුතුය. | රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක උපදේශක තනතුරක වසර 02 ට නොඅඩු කාලයක් උපදේශකයෙක් ලෙස කටයුතු කර සහතික ලබා තිබීම |
| 07 | **සංගීත හා නැටුම් උපදේශක** | අ. 18 නොඅඩු අ. 30 නොවැඩි | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) ත් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ජාතික නැටුම් හා සංගීත විභාගය සමත්වීම / භාත්ඛණ්ඩ සංගීත විද්‍යාපීඨ නැටුම් හා සංගීත ඩිප්ලෝමා සහතිකය හෝ ජාතික තරුණ සේවා සභාවේ මෙල්වුඩ් ආයතනයේ නැටුම් හා සංගීත ඩිප්ලෝමා සහතිකය ලබා තිබිය යුතුය. | රජයේ හෝ රජයේ ලියාපදිංචි ආයතනයක උපදේශක තනතුරක වසර 02 ට නොඅඩු කාලයක් උපදේශකයෙක් ලෙස කටයුතු කර සහතික ලබා තිබීම. |
| 08 | **උපදේශක (පරිගණක පුහුණු)** | අ. 18 නොඅඩු අ. 30 නොවැඩි | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) ත් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) පිළිගත් රාජ්‍ය හෝ පෞද්ගලික ආයතනයක අවම වශයෙන් එක් වසරක පරිගණක ඩිප්ලෝමාවක් හදාරා අවසාන සහතිකය ලබා තිබිය යුතුය. | |
| 09 | **ක්‍රීඩා උපදේශක** | අ. 18 නොඅඩු අ. 25 නොවැඩි | සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් හයකින් (06) ත් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | රජයේ පිළිගත් ආයතනයක ක්‍රීඩා කළමනාකරණය / ක්‍රීඩාංගණ හා සංවර්ධනය පිළිබඳ අවම වශයෙන් මාස 06 ක පාඨමාලාවක් සාර්ථකව හදාරා තිබීම සහ ජාත්‍යන්තර හෝ ජාතික ක්‍රීඩා පුහුණුකරු / ක්‍රීඩා තරඟ විනිසුරු පාඨමාලාවක් හදාරා තිබීම<br>හෝ ජාත්‍යන්තර හෝ ජාතික ක්‍රීඩා පුහුණුකරු / තරඟ විනිසුරු වශයෙන් කටයුතු කර තිබීම<br>හෝ ජාතික මට්ටමේ හෝ පළමු පෙළ ක්‍රීඩා තරඟ සඳහා කේවල / කණ්ඩායම් නියෝජනය කර තිබීම. | පාසල් මට්ටමේ හෝ ක්‍රීඩා සමාජ මට්ටමේ පුහුණුකරුවෙකු ලෙස අවම වශයෙන් වසර 02 පළපුරුද්දක් ලබා තිබීම. |

**1.4 බඳවා ගැනීමේ ක්‍රමය :**

| | තනතුර | බඳවා ගැනීමේ ක්‍රමය | විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | අවම සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| 01 | පෙර පාසල් ගුරු | ලිඛිත පරීක්ෂණය | අභියෝගීතාව හා බුද්ධි පරීක්ෂණය<br>සාමාන්‍ය දැනීම | 100<br>100 | 40<br>40 |
| 02 | පුස්තකාල සහකාර | ලිඛිත පරීක්ෂණය | සාමාන්‍ය දැනීම<br>බුද්ධි පරීක්ෂණය | 100<br>100 | 40<br>40 |
| 03 | සෞඛ්‍ය උපදේශක | ලිඛිත පරීක්ෂණය | සාමාන්‍ය දැනීම<br>බුද්ධි පරීක්ෂණය | 100<br>100 | 40<br>40 |
| 04 | මැහුම් උපදේශක | | | | |
| 05 | උපදේශක (කාර්මික පුහුණු) | | | | |
| 06 | ප්‍රදර්ශක උපදේශක | | | | |
| 07 | සංගීත හා නැටුම් උපදේශක | | | | |
| 08 | උපදේශක (පරිගණක පුහුණු) | | | | |
| ❖ ලිඛිත විභාගයේදී ලබා ගන්නා කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබේ. | | | | | |
| 09 | ක්‍රීඩා උපදේශක | ලිඛිත පරීක්ෂණය | මූලික ක්‍රීඩා දැනුම<br>අභියෝගීතාවය | 100<br>100 | 50<br>50 |
| | | ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය | අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>අතිරේක වෘත්තීය සුදුසුකම්<br>ක්‍රීඩා කුසලතා<br>පෞරුෂත්වය | 10<br>20<br>65<br>05 | 50 |

❖ ලිඛිත පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලිඛිත විභාගයේ සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ.

**02. තනතුරු නාමය : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ භෙසජ්ජක තනතුර (Ayurvedic pharmacist)**

**2.1 මාසික වැටුප් පරිමාණය :** MT 2-2016 (රා.ප.ච. 03/2016 අනුව)
රු. 30,140 - 10 x 350 - 11 x 370 - 10 x 560 - 10 x 660 - 49,910

**2.2 වයස් සීමාව / අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම් වෙනත් සුදුසුකම්**

| තනතුර | වයස් සීමාව | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| භෙසජ්ජක | අ. 18 නොඅඩු අ. 35 නොවැඩි | අ.පො. ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව, ගණිතය හා විද්‍යාව යන විෂයන් ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව එක් වරකදී විෂයන් හයකින් සමත් වීම සහ අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් සමත්ව තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් පවත්වනු ලබන ද්විවර්ෂ භෙසජ්ජක පාඨමාලාව හදාරා සහතික පත් ලැබ ආයුර්වේද වෛද්‍ය සභාවේ භෙසජ්ජකවරයෙක් ලෙස ලියාපදිංචිය ලබා තිබීම. |

**2.3 බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| විෂයානුබද්ධ දැනුම<br>ක්ෂේත්‍රයට අදාළ පළපුරුද්ද<br>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 35<br>10<br>05 | 50% |
| ❖ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙළ අනුව පවත්නා පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. | | |

**03. තනතුරු නාමය : බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ගිනි නිවීම් සේවයේ ගිනිහට තනතුර (fireman)**

**3.1 මාසික වැටුප් පරිමාණය :** RS1-2016 (රා.ප.ච. 03/2016 අනුව)
රු. 29,540 - 7 x 300 - 27 x 370 - 41,630

**3.2 වයස් සීමාව / අධ්‍යාපන සුදුසුකම් / වෘත්තීය සුදුසුකම් / වෙනත් සුදුසුකම්**

| තනතුර | වයස් සීමාව | අධ්‍යාපන සුදුසුකම් | වෙනත් සුදුසුකම් |
|---|---|---|---|
| ආධුනික ගිනිහට | අ. 18 නොඅඩු අ. 24 නොවැඩි | එක් වරක දී සිංහල / දෙමළ භාෂාව හා ගණිතය ඇතුළුව විෂයන් හතරකට සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයන් හයකින් සමත්ව තිබිය යුතු අතර එම අවස්ථාවේදීම හෝ තවත් එක් අතිරේක අවස්ථාවකදී විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව විෂයන්ද සමත්ව තිබිය යුතුය. | අවිවාහක පිරිමි අයකු විය යුතුය.<br>උස සෙ. මී. 162 කට නොඅඩු සහ පෙවි ස්කන්ධ දර්ශකය නියමිත පරිදි තිබිය යුතුය. (පෙවි ස්කන්ධ දර්ශකය 18.5 සිට 24 දක්වා විය යුතුය)<br>උපැස් යුවළක් හෝ ස්පර්ශ කාච රහිත ඇස් පෙනීම අවම වශයෙන් 6/6 සහ 6/12 අතර. වර්ණ පෙනීම ද සාමාන්‍ය විය යුතුය.<br>කැපීම් ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය. (පච්ච කොටා තිබීම වැනි)<br>යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර, නීති විරෝධී ක්‍රියාවන්ට සම්බන්ධ නොවූ අයකු බව පොලිස් වාර්තාවකින් සනාථ කළ යුතුය. |

**3.3 බඳවා ගැනීමේ ක්‍රමය**

ලිඛිත පරීක්ෂණයෙන් හා වෘත්තීය (ප්‍රායෝගික) පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව පුරප්පාඩු සඳහා ආධුනික ගිනිහටයන් වශයෙන් තෝරා ගනු ලැබේ.

- I. පුහුණුව ආරම්භ කිරීමට පෙර සියලුම ආධුනික ගිනිහටයන් කායික, මානසික යෝග්‍යතාවය තහවුරු කිරීම සඳහා වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ.
- II. පුරප්පාඩු සඳහා තෝරා ගන්නා අයවලුන් එක් අවුරුදු ගිනිහට පුහුණු පාඨමාලාව හැදෑරිය යුතුය. පුහුණු කාල සීමාව තුළදී වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක නොවන හෝ අපේක්ෂිත රැකියා මට්ටමට ළඟා නොවන ආධුනික ගිනිහටයන් කිසිම වන්දියකින් තොරව පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ.
- III. සාර්ථකව අදාළ පුහුණුව අවසන් කරන ආධුනික ගිනිහටයින් ගිනිහට තනතුර සඳහා ස්ථිරව බඳවා ගනු ලැබේ. පුහුණු කාල සීමාව ස්ථිර සේවා කාලය සඳහා ගණනය කරනු ලබන අතර, අදාළ වැටුප් පරිමාණයේ දෙවන පියවරේ පිහිටුවනු ලැබේ.
- IV. පුහුණු කාල සීමාව තුළ මාසිකව රු. 10,000/- ක දීමනාවක් ගෙවනු ලැබේ.
- V. පුහුණු කාල සීමාව තුළදී කිසිම ආධුනික ගිනිහටයකුට විවාහ වීමට අවසර දෙනු නොලැබේ.
- VI. පුහුණුවට තෝරා ගන්නා ලද ආධුනික ගිනිහටයින් ස්ථිර තනතුරට පත් කිරීමෙන් අනතුරුව පත් කළ දින සිට වසර 05 කාල සීමාවක් අදාළ පළාත් පාලන ආයතනයේ සේවය කරන බවට පත්වීම් බලධාරියා සමඟ රු. 500,000/- ක වටිනාකමකින් යුත් බැඳුම්කරයක් පුහුණුව ආරම්භකරන අවස්ථාවේදී අත්සන් කළ යුතුය.
- VII. ආධුනිකයාගේ අභිමතය පරිදි පුහුණු කාලය තුළ පුහුණුවෙන් ඉවත් වන්නේ නම් පුහුණුවට වැයවූ සියලුම වියදම් ආයතනය වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.
- VIII. ගිනිහට තනතුර සඳහා පත්වීම් ලැබූ පත්වීම් ලාභීන්ට කොළඹ මහා නගර සභා බල ප්‍රදේශයේ පදිංචි වන ලෙස නියම කළ හැකිය.

**04. ඉහත සියලු තනතුරු සඳහා අවශ්‍ය වෙනත් සුදුසුකම්**

- I. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- II. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- III. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
- IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
- V. තනතුරේ රාජකාරි ඉටුකිරීම සඳහා ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**05. තනතුරු වල ස්වභාවය**

- ❖ මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව අනාගතයේදී රජය විසින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට ඔබ යටත් විය යුතුය.
- ❖ වැන්දඹු අනත්දරු හා වැන්දඹු පුරුෂ අනත්දරු අර්මුදල් සඳහා දායක මුදල් ගෙවිය යුතුය.
- ❖ මෙම බඳවා ගැනීම් ස්ථිර පදනම් මත සිදු කරන අතර, කොළඹ මහා නගර සභාව මගින් ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණවලට ඔබ යටත් විය යුතුය.

මෙම තනතුරු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය පත්වීම් බලධාරියා සතු වේ.

**2020 දෙසැම්බර් මස 02 දින**
**කොළඹ මහා නගර සභාවේ,**
**නාගරික කොමසාරිස් කාර්යාලයේ දිය.**

**නිහිනෙදූ රෝෂණී දිසානායක,**
**නාගරික කොමසාරිස්,**
**කොළඹ මහා නගර සභාව.**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

## ආදර්ශ අයදුම්පත්‍රය

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ තනතුරු සඳහා බඳවාගැනීමේ අයදුම්පත

**ඉල්ලුම් කරන තනතුර :-** ..............................................................................

1. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්).- (MR/MS/MRS)
2. සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................................
3. I. ස්ථිර ලිපිනය (සිංහලෙන්) : ..............................................................................
   II. තාවකාලික ලිපිනය (සිංහලෙන්) : ..............................................................................
4. උපන්දිනය : අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
   (සහතික කරන ලද පිටපත් ඇමිණිය යුතුයි.)
5. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු ☐☐ මාසය ☐☐ දිනය ☐☐
6. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐
7. විවාහක / අවිවාහක බව : ..............................................................................
8. දුරකථන අංක පෞද්ගලික : ..............................................................................
   කාර්යාලීය : ..............................................................................
   විද්යුත් තැපැල : ..............................................................................
9. බස්නාහිර පළාතේ පදිංචි කාල සීමාව : ..............................................................................
   (සහතික කරන ලද ග්‍රාමසේවා සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය)
10. අධ්‍යාපන සුදුසුකම් : ..............................................................................
    (සහතික කළ ඡායා පිටපත් මගින් සනාථ කළ යුතුය)
11. වෘත්තීය සුදුසුකම් : ..............................................................................
    (සහතික කළ ඡායා පිටපත් මගින් සනාථ කළ යුතුය)
12. වෙනත් සුදුසුකම් : ..............................................................................
13. I. ඔබ කිසියම් සාපරාධී වරදක් සම්බන්ධයෙන් කෙදිනකදී හෝ උසාවියකදී වරදකරු වී තිබේද? ඔව්/නැත
    II. ඔබගේ පිළිතුර ඔව් නම් වරදේ ස්වභාවය හා දඬුවම කුමක්ද? ..............................................................................
14. ඔබ රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයෙන් මීට පෙර සේවයෙන් පහකළ හෝ සේවයෙන් ඉල්ලා අස්වූ තැනැත්තෙක්ද? (ඔව්/නැත)
15. ඔබ දනට රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර / තාවකාලික / අනියම් / ආදේශක / කොන්ත්‍රාත් පදනමින් යම් තනතුරක් දරයි නම්,
    I. දනට දරණ තනතුර : ..............................................................................
    II. එම තනතුරට පත්වූ දිනය : ..............................................................................
    III. එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/තාවකාලික/අනියම්/කොන්ත්‍රාත්) : ..............................................................................
    IV. සේවය කරන දෙපාර්තමේන්තුව/අංශය : ..............................................................................

ඉහතින් මා විසින් සඳහන් කරන ලද කරුණු මාගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටින අතර, කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තනතුරකට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා එම තනතුරට නුසුදුස්සෙකු වන බවත්, බඳවාගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියකින් තොරව සේවයෙන් පහ කළ හැකි බවත් මා දනිමි.

දිනය : ..............................                                                            ..............................
අයදුම්කරුගේ අත්සන

Source: Dinamina, Daily News (2020.12.04)